විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

නිපුණතාව - ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

නිපුණතා මට්ටම - තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩ නඟා ගනී

පාඩම -17 පාඩම - වළකිමු වරදින් උපමා කොට තමන්

ෙ

# වළකිමු වරදින් උපමා  කොට තමන්

## I - කොටස

**නිවැරදි  පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. බුදුරජාණන් වහන්සේ වේළුද්වාර  සූත්‍රය දේශනා කරනු ලැබුවේ

    1. ශාක්‍යකුල වංශිකයන්ට ය
    2. පස්වග මහනුන්ට ය
    3. වේළුද්වාර ග්‍රාමවාසී බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට ය
    4. බිම්බිසාර රජතුමාට ය

2. අත්තුපනායික ධර්මය ලෙස හැඳින්වෙන්නේ

    1. ප්‍රාණඝාතයෙන් වෙන් වීමයි
    2. තමා උපමාකොට අන් අය ගැන සිතීමයි
    3. ධර්මයේ සඳහන් වන නිසා වරදින් මිදීමය
    .4 ලෝකයාට බයේ වැරදි නොකිරීමය

3. තමාටත් අනුන්ටත් මෙලොවටත් පරලොවටත් පලක් නොමැති නිෂ්පල වචන කතාකිරීම

    1. සුභාශිත වචන ලෙස හැඳින් වේ
    2. නපුරු රළු වචන ලෙස හැඳින් වේ
    3. හිස් වචන ලෙස හැඳින් වේ
    4. අර්ථවත් වචන ලෙස හැඳින් වේ

4. අප සමාජයේ ජීවත්වන සෑම අවස්ථාවකදී ම ක්‍රියා කළ යුතු වන්නේ

    1. තමාගේ දියුණුවටම පමණක් කටයුතු කිරීමය
    2. අන් අයගේ දියුණුවම සිතා කටයුතු කිරීමය
    3. තමාගේත් අන් අයගේත් දියුණුවඋදෙසා කටයුතු කිරීමය
    4. තමාගේ ප්‍රසිද්ධිය උදෙසා කටයුතු කිරීමය

5. අදත්තාදානය ලෙස හැඳින්වෙන්නේ

    1. ප්‍රාණඝාතයයි
    2. නොදුන් දේ ගැනීමයි
    3. අයුතු ලෙස කමසැප විඳීමයි
    4. දන් දීමයි

## වළකිමු වරදින් උපමා කොට තමන්

## II - කොටස

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1. ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය සරල අදහස හඳුනාගෙන එම කරුණු තුන ලියන්න
2. " සබ්බෙ තසන්ති දණ්ඩස්ස " යන
    i. ධම්මපද ගාථාව ලියන්න .
    ii. එම ගාථාවේ සරල අදහස ඔබේ වචනයෙන් ලියන්න.
3. වේළුද්වාර සූත්‍රයෙන් ගත හැකි දහම් කරුණු සැලකිල්ලට ගෙන දැනට පවතින වසංගත තත්ත්වයෙන් ඔබ හා අනෙක් අය බේරා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියා දක්වන්න
4. අධිපති ධර්ම නම් කරන්න.
5. සිව් වැදෑරුම් වාග් විසමාචාරය දක්වන්න

## 7 ශ්‍රේණිය

## 17- පාඩම - වළකිමු වරදින් උපමා කොට තමන්

## පිළිතුරු - I - කොටස

1. වේළුද්වාර ග්‍රාමවාසී බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට ය .
2. තමා උපමා කොට අන් අය ගැන සිතීමයි .
3. හිස් වචන ලෙස හැඳින් වේ .
4. තමාගේත් අන් අයගේත් දියුණුව උදෙසා කටයුතු කිරීමයි.
5. නුඳුන් දේ ගැනීමයි.

## පිළිතුරු - II - කොටස

1.
   i. තමා වරදින් වැළකීම
   ii. අන්‍යයන්ද ඉන් වැළැක්වීම
   iii. වරදින් වැළකීමේ ගුණ වර්ණනා කිරීම

2.
   i. සබ්බෙ තසන්ති දණ්ඩස්ස
      සබ්බේසං ජීවිතං පියං
      අත්තානං උපමං කත්වා
      නහනෙයිය ඝාතයේ

   ii. සියල්ලෝ ම දඬුවමට බිය වෙති . සියල්ලන්ටම ජීවිතය ප්‍රිය ය .තමන් උපමා කොට අනුන් ඝාතනය නොකළ යුතුය .නොකරවිය යුතුය .

3. තමා රෝගයෙන් වැළකීම හා අන් අයට රෝගය බෝ නොවන පරිදි හැසිරීම

උදා ; මුඛ ආවරණ පැළඳීම

මීටරයක දුරස්ථභාවය පවත්වා ගැනීම

තමා රෝග ආශ්‍රිතයෙකු නම් වෙන්ව විසීම (නිරෝධායනය වීම )

තම හිතවතුන් ඒ පිළිබඳව දැනුවත් කර ඔවුන්ද රෝගයට ගොදුරු නොවන පරිදි කටයුතු කිරීමට යොමු කිරීම



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

4.

- අත්තාධිපති
- ලෝකාධිපති
- ධම්මාධිපති

5.

i. බොරු කීම
ii. කේලාම් කීම
iii. නපුරු වචන කතා කිරීම
iv. නිශ්ඵල වචන කතා කිරීම